# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

### මාර්ගගත ඩිජිටල් ලොතරැයි විසඳුමක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම සඳහා ආයෝජකයකු තෝරා ගැනීම

### (IFB) අංකය : MT/FIN/15/PROC./07

01. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද, ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින්, මාර්ගගත ඩිජිටල් ලොතරැයි විසඳුමක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම සඳහා ආයෝජකයකු තෝරා ගැනීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ. කොන්ත්‍රාත් කාලය අවුරුදු දහයකි (10)

02. ලංසු කැඳවීම, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් හි දක්වෙන පරිදි, ජාත්‍යන්තර තරගකාරී ලංසු පටිපාටිය (ICB - Two Envelope System : Single Stage- Two Envelope Bidding Procedure) අනුව සිදු කෙරෙන අතර, මාර්ගෝපදේශයන්හි අර්ථ දක්වා අති සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන්ට විවෘත වේ.

කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා ආසාධු ලේඛනගත නොවූවෙක් විය යුතුය. එමෙන්ම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා පහත දක්වෙන අවම සුදුසුකම් නිර්ණායක සපුරා තිබීම අනිවාර්ය වේ.

අ) සාමාන්‍ය අවම පළපුරුද්ද: ලංසුකරුවාහට ලංසු භාර ගැනීමේ අවසාන දිනයට පෙර වසර දහයක (10) වත් මාර්ගගත ලොතරැයි කොන්ත්‍රාත්තුවක, කොන්ත්‍රාත්කරුවා ලෙස උප කොන්ත්‍රාත්කරුවා ලෙස හෝ කළමනාකරණ කොන්ත්‍රාත්කරුවා ලෙස සාමාන්‍ය පළපුරුද්දක් තිබිය යුතුය.

ආ) විශේෂිත පළපුරුද්ද: ලංසුකරුවා අවම වශයෙන්, රජය වෙනුවෙන් හෝ රාජ්‍ය හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් දැනට පවත්වාගෙන යන මාර්ගගත ලොතරැයි ව්‍යාපෘති දෙකක් (02) වත් සාර්ථකව නිමකර තිබිය යුතුය. එක් එක් ව්‍යාපෘතියක් අවම වශයෙන් වර්ෂයකට ලොතරැයිපත් මිලියන 180 ක් වත් නිකුත් කර තිබිය යුතුය.

ඇ) වාර්ෂික සාමාන්‍ය පිරිවැටුම: ලංසුකරුට පසුගිය වසර 3 ඇතුළත සම්පූර්ණ කරන ලද හෝ දැනට කරමින් පවතින කොන්ත්‍රාත් සඳහා ලැබූ සහතික කරන ලද, ආදායමෙහි, වාර්ෂික සාමාන්‍ය අගය ඇ. ඩො මිලියන 100 ක් විය යුතුය.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ඒ.පී.එන්.එම්. පටබැඳිගේ මිය, ප්‍රධාන ගණකාධිකාරී, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය ජංගම: +94714251643, දුර : +94112110577 විද්‍යුත් තැපැල් ලිපිනය : **ca@trademin.gov.lk** වෙතින් 2024 ජූලි 14 වෙනිදා සිට සාමාන්‍ය වැඩ කරන දිනයන්හිදී 09.00 පැය සිට 16.00 පැය දක්වා ලබා ගත හැක. පරීක්ෂා කර බැලීම සඳහා පමණක් ලංසු ලේඛන වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයෙහි වෙබ් අඩවියෙහි **(https://www.trade.gov.lk/)** ප්‍රසිද්ධකර ඇත.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් **වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය** කාර්යාලයෙන් ව්‍යාපාරික ලිපි ශීර්ෂයක ලියන ලද, ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා නැවත නොගෙවන ශ්‍රී ලංකා රුපියල් 500,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් ලබාගත හැක. ගෙවීම් මුදලින් පමණි.

05. ලංසු 2024 අගෝස්තු 27 වන දින 15.00 පැයට පෙර පහත හයවන (6) ඡේදයෙහි දක්වෙන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2024 අගෝස්තු 27 වන දින 15.00 පැයට, ලංසු භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම සහභාගී වීමට තෝරාගත් ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී ලංසු විවෘත කරනු ලැබේ. සෑම ලංසුවක් සමගම, ශ්‍රී ලංකා රුපියල් මිලියන සියයකට (LKR 100 Million) නොඅඩු හෝ එම අගය ලංකාවේදී පහසුවෙන් හුවමාරු කළ හැකි විදේශ මුදලකින් ලංසු සුරක්ෂණයක්, බැංකු ඇපකරයක් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

06. පූර්ව ලංසු රැස්වීමක් 2024 ජූලි 30 වන දින 10.30 පැයට කොළඹ 03, ආර්. ඩී. ඒ. මෙල් මාවතේ අංක 492, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 4 වෙනි මහලෙහිදී පැවැත් වේ.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව,**
**වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,**
**අංක 492, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 03.**
**2024 ජූලි 10.**